# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 757 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 05/05/2024 පැය 0540

# මාධ්‍ය නිවේදනය

## 01. පුද්ගලයෙකු දියේ ගිලී මියයාමක් - වැලිගම පොලිස් වසම

2024.05.04 වන දින දහවල් කාලයේ වැලිගම පොලිස් වසමේ කපුවත්ත ප්‍රදේශයේ ගන්දුව මුහුදු වෙරළ තීරයේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට වැලිගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ කොලේදණ්ඩ, වැලිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයින් දෙදෙනෙකු සමඟ වැලිගම කපුවත්ත ප්‍රදේශයේ ගන්දුව මුහුදු වෙරළ තීරයේ දිය නෑමට ගොස් සිට ඇති අතර ඉන් මරණකරු හා තවත් පුද්ගලයෙකු මුහුදේ මීටර් 25 – 30 ක් දුර ඇවිද ගොස් ඇත. එම අවස්ථාවේදී මරණකරු මුහුදු රළකට හසු වී ගසාගෙන ගොස් දියේ ගිලී ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. අනෙක් පුද්ගලයා ගොඩට පීනා දිවි බේරාගෙන ඇත. මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැම්පත් කර ඇති අතර වැලිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

## 02. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන්වීමක් - පමුණුගම පොලිස් වසම

2024.05.04 වන දින සවස් කාලයේ පමුණුගම පොලිස් වසමේ තල්දියවත්ත බේසම මුහුදු වෙරළේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන් වී ඇති බවට පමුණුගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ පුද්ගලයා වයස අවුරුදු 28 ක් වූ නිව් පෝට්මෝර් වත්ත, ආඟරපතන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදහන් වූ පුද්ගලයා තම මිතුරන් සමඟ ඉහත සඳහන් ස්ථානයේ දිය නාමින් සිටියදී රළ පහරකට හසු වී ගසාගෙන ගොස් ඇති බවත්. මේ දක්වා මෙම පුද්ගලයා

හමු වී නොමැති බවත්, සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. අතුරුදහන් වූ පුද්ගලයා සොයා ගැනීම සඳහා අවශ්‍ය සහාය ලබාගැනීමට පොලිස් නාවික කොට්ඨාසය හා ශ්‍රී ලංකා නාවික හමුදාව දැනුවත් කර ඇත. පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**03. ගජමුතු 03 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - දිවුලපිටිය පොලිස් ස්ථානය.**

2024.05.04 වන දින දහවල් කාලයේ දිවුලපිටිය පොලිස් වසමේ දිවුලපිටිය නගරයේදී රුපියල් කෝටි 03 ක මුදලකට අළෙවි කිරීමට සූදානම්ව තිබූ ගජමුතු 03 ක් සැකකරුවන් දෙදෙනෙකු කාර් රථයකින් ප්‍රවාහන කරමින් සිටියදී දිවුලපිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 43 වයස් වල පසුවන මීගමුව හා ගල්කුලම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම ගජමුතු සම්බන්ධයෙන් කෞතුකාගාර දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් කැඳවා ඉදිරි නීතිමය පියවර ගැනීමට නියමිතව ඇති අතර දිවුලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. සැකකටයුතු මරණයක් - ලුණුගල පොලිස් වසම.**

2024.05.04 වන දින දහවල් කාලයේ ලුණුගල පොලිස් වසමේ පීස්ස කෙසෙල්වත්ත ප්‍රදේශයේ කුඹුක්කන් ඔයේ පුද්ගල මෘත ශරීරයක් ඇති බවට ලුණුගල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද පැමිණිල්ලක් මත සිදුකල සෝදිසි කිරීමකදි කුඹුක්කන් ඔයේ තිබි පිරිමි මෘත ශරීරයක් සොයා ගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වූ හෝප්ටන්, ලුණුගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරු 2024.05.03 වන දින උදෑසන කාලයේ ලුණුගල නගරයට පිටව ගොස් නැවත එදින රාත්‍රිය වන තෙක් නිවසට නොපැමිණ ඇති අතර නොපැමිණීම මත නිවැසියන් 2024.05.04 වන දින ලුණුගල පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදුකර ඇත. මරණකරු සැක කටයුතු ලෙස ඉහත ස්ථානයේ මියගොස් සිටියදී සොයාගෙන ඇත.

මෘත ශරීරය බදුල්ල රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර ලුණුගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දෙමටගොඩ පොලිස් ස්ථානය.**

2024.05.04 වන දින උදෑසන කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ කළු පාලම අසලදී දෙමටගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත

වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 420 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වන මාලිගාවත්ත, කොළඹ 09 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙමටගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කිරිබත්ගොඩ පොලිස් ස්ථානය.**

2024.05.04 වන දින දහවල් කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ ටයර් හන්දිය අසලදී කිරිබත්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන හුණුපිටිය, වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කිරිබත්ගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. මාරක රිය අනතුරක් - බෙන්තොට පොලිස් වසම.**

2024.05.04 වන දින සවස් කාලයේදී බෙන්තොට පොලිස් වසමේ කොළඹ ගාල්ල ප්‍රධාන මාර්ගයේ අලවතුගොඩ ප්‍රදේශයේදි ඇල්පිටිය දෙස සිට ගාල්ල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් එම දිසාවටම මාර්ගයේ ගමන් ගත් පදික කාන්තාවකගේ සහ ඇ සමඟ පයින් ගමන් කරමින් සිටි ගැහැණු දරුවෙකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික කාන්තාව හා ගැහැණු දරුවා තුවාල ලබා බෙන්තොට රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව පදික කාන්තාව වැඩිදුර ප්‍රතිකාර සඳහා නාගොඩ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත. ගැහැණු දරුවා ප්‍රතිකාර ලබා රෝහලින් පිටව ගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 63 ක් වූ රොබෙල්ගොඩ, බෙන්තොට ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. බෙන්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**